**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2017**

---

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලීය පනතේ 21(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විද්‍යාලයේ සේනාවිධායක වෙත 2018 අප්‍රේල් 24 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000-1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව, දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපල පිරියත හා උපකරණ පන්තිය මුලුමනින්ම ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් වාහන, ලීබඩු උපකරණ හා පරිගණක හා උපාංග යන වත්කම් ප්‍රත්‍යාගණනයේදී තෝරාගත් වත්කම් කිහිපයක් පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. තවද, ප්‍රමිතයේ 43 ඡේදය ප්‍රකාරව, පිළිගත් හා වෘත්තීය සුදුසුකම් ඇති තක්සේරුකරුවකු විසින් වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය, තක්සේරුකරු පිළිබඳ තොරතුරු, වත්කම්වල සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේදී අනුගමනය කල ක්‍රමවේද සහ වැදගත් උපකල්පනයන් හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල නිදහස් කර තිබුණු රු.1,321,756 ක් වූ රැඳවුම් මුදල් එම ගිණුමට හර කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට රැඳවුම් මුදල් ගිණුමේ හා ගොඩනැගිලි ගිණුමේ පිරිවැය එම වටිනාකමින් හා ගොඩනැගිලි ක්ෂය රු.26,435 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද, ආපසු අයකරගන්නා ලද රැඳවුම් මුදල් රු.96,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) විද්‍යාලයේ ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ප්‍රත්‍යාගණනය කර තිබූ වත්කම් රු.23,640,000 කට අදාලව ක්ෂය හා ක්‍රමක්ෂය ලෙස රු.4,728,000 ක්, වැඩියෙන්

ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම්වල ශුද්ධ අගය සහ ප්‍රාග්ධන ප්‍රදානයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(ii)** 2016 දෙසැම්බර් 31 දිනට ක්ෂය කර අවසන්ව තිබූ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලදී ගෙන තිබූ පරිගණක හා උපාංගවලට අදාලව ප්‍රවර්තන වර්ෂයේදී රු.1,758,068 ක් තවදුරටත් ක්ෂය ලෙස ගිණුම්ගතකර තිබීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදානයන් හා වත්කම්වල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**(iii)** 2016 වර්ෂයේදී ඉන්ධන මනුකරණයට අදාල ක්ෂය රු.1,528,912 ක් යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම් ගිණුමට බැර කිරීම වෙනුවට රු.872,150 ක් හර කර තිබීම හේතුවෙන් යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.2,401,062 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**(iv)** 2013 වර්ෂයේදී මිලදීගෙන තිබූ රු.265,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරය සඳහා ප්‍රවර්තන වර්ෂයට අදාලව රු.53,000 ක් වූ ක්ෂය ගිණුම් ගත කර නොතිබුණි.

(v) 2016 වර්ෂයේ විද්‍යාලයීය අරමුදල් වලින් මිලදීගෙන තිබූ හා පුස්තකාල පොත්වලට අදාල ක්ෂය රු.464,762 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රමක්ෂය ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ඌනතාවය සහ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) විද්‍යාලයේ වත්කම් හා පාරිභෝගික ද්‍රව්‍ය තොග ගිණුම් තැබීම සම්බන්ධයෙන් විගණනයේදී හෙළිදරව් වූ අඩුපාඩු පහත දැක්වේ.

**(i)** වටිනාකම රු.836,421 ක් වූ කොට්ටඋර, බෙඩ්ෂීට්, මේස රෙදි යනාදී ප්‍රාග්ධන ස්වරූපයේ නොවන භාණ්ඩ වර්ග 09 ක් වියදම් ලෙස ලියාහැරීම වෙනුවට යන්ත්‍ර හා උපකරණ යටතේ ප්‍රාග්ධනීත කර තිබුණි.

**(ii)** සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.192,444 ක් වටිනා පරිගණක පුටු, මේස, ලීබඩු හා කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කල යුතු වුවද ඒවා යන්ත්‍ර සහ උපකරණ යටතේ දක්වා තිබීම හේතුවෙන් ලීබඩු ගිණුම රු.192,444 ක් අඩුවෙන් සහ යන්ත්‍ර ගිණුම රු. 192,442 ක් වැඩියෙන් දක්වා තිබූ අතර රු.14,433 ක ක්ෂය අඩුවෙන් දක්වා තිබුණි.

**(iii)** ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉංජිනේරු සේවා රෙජිමේන්තු ගබඩාවේ පැවති වටිනාකම රු.7,594,126 ක් වූ තොග වර්ග 5 කට අදාල තොග විෂයයන් 22,118 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2013 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් විද්‍යාලයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේදී අනුමත කොන්ත්‍රාත්තුවට සමගාමීව රු.6,198,670 ක් වටිනා මාර්ග කොටසක් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් නොමැතිව ප්‍රතිසංස්කරණය කර තිබුණි. මේ සඳහා රු.3,374,169 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතුව තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විද්‍යාලය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ගෙවිය යුතුව පැවති රු.10,992,853 ක ණය ශේෂයක් වසර 5 කට වඩා අධික කාලයක් ගතවී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ 2 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් 2011 වර්ෂයේ සිට 2014 කාලයට අදාල රු.294,199 ක රැඳවුම් මුදල් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |

**3 මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,667,249 ක ඌනතාවයක් වු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,665,356 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.998,107 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු.25,606,868 කින් වැඩිවී තිබුණද ආදායම රු.26,604,974 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2015 වර්ෂයේදී හැර 2012 වර්ෂයේ සිට 2017 දක්වා කාලය තුල මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවයන් දක්නට ලැබුණු අතර එය වාර්ෂිකව උච්චාවචනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු විද්‍යාලයේ දායකත්වය 2012 වර්ෂයේ රු.21,327,028 ක් වූ අතර මෙම අගය 2017 වර්ෂය වන විට රු.42,198,472 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී විද්‍යාලයේ ජංගම අනුපාතය 0.27 සිට 0.1 දක්වා අඩු වී තිබීම හේතුවෙන් දුර්වල කාරක ප්‍රාග්ධන කළමනාකරණයක් පවතින බව නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 සැලසුම් කිරීම

2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී දිගුකාලීන දැක්මක් සහිතව අදාල පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම, අභ්‍යන්තර විගණන සැලැස්ම ආදී කරුණු ඇතුළත් විය යුතුය. එසේ වුවද, 2017 වර්ෂයේ මාණ්ඩලික විද්‍යාලය විසින් පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රාග්ධන වියදම් හා ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා දැරීමට අපේක්ෂිත වියදම් පමණක් ඇතුළත් කර තිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්ව සමාලෝචනය

2008 අංක 5 දරන ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාල පනත ප්‍රකාරව, සන්නද්ධ හමුදාවල නිලධාරීන්ට පත්වීම් සහ උසස් වීම සඳහා ඔවුන්ට අවශ්‍ය වෘත්තීය දැනුම ලබාදීම හා මාණ්ඩලික විද්‍යාලයේ පුහුණුව ලබන නිලධරයින්ට අණ හා මාණ්ඩලික කර්තව්‍ය යන අවස්ථා දෙකෙහිම ඵලදායීව ක්‍රියාකිරීම සඳහා සූදානම් කිරීම විද්‍යාලයේ මූලික අරමුණ වේ. සමාලෝචිත වර්ෂයේදී විද්‍යාලය විසින් පවත්වා තිබුණු උපාධි පාඨමාලාව ශිෂ්‍යයන් 128 දෙනෙකු සම්පූර්ණ කර තිබුණු අතර එක් ශිෂ්‍යයෙකු වෙනුවෙන් රු.1,129,923 ක පිරිවැයක් දරා තිබුණි.

### 4.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2015 ජූලි 10 දිනැති අංක 2/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආයතන සතු අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන මෙම චක්‍රලේඛයේ දින සිට මාස 3 ක් ඇතුලත අපහරණය කල යුතු බව දක්වා තිබුණි. එහෙත් විද්‍යාලය සතු යතුරු පැදි දෙකක් හා බවුසර් ට්‍රේලරයක් වසර දෙකකට අධික කාලයක සිටද, ට්‍රක් රථයක් වසර පහකට අධික කාලයක සිටද ධාවනයෙන් ඉවත් කර විද්‍යාල පරිශ්‍රය තුල ගාල්කර දිරාපත් වෙමින් පැවතියද චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

2011 වර්ෂයේදී විද්‍යාලය වෙත පවරා තිබූ තරුණ සේවා සභාවට අයත් හෙයියන්තුඩුව ප්‍රදේශයේ පිහිටි ඉඩම් අක්කර 11 ක් සහ විද්‍යාලයේ කටයුතු සඳහා යොදාගනු ලබන ආරක්ෂක අමාත්‍යාංශයට අයත් ප්‍රත්‍යාගණන වටිනාකම රු.2,100,000 ක් වූ බස්රථය හා යුධ හමුදාව වෙතින් ලබාදී තිබුණු පිරිවැය රු.19,610,000 ක් වූ වෙනත් වාහන 12 ක් මෙම වාර්තාවේ දින වන විටත් විද්‍යාලය වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

2012 අංක 13 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය (සංශෝධිත) පනතේ 22(2) වගන්තිය අනුව, විද්‍යාලයේ ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත්කල යුතු වුවත්, 2015 වර්ෂයේ පුරප්පාඩු වූ එම තනතුරට මෙම වාර්තාවේ දින වන විටත් එම සේවයේ නිලධාරියෙකු පත්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. තවද, පනත ප්‍රකාරව මාණ්ඩලික විද්‍යාලයේ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍යවන මහාචාර්ය පදවි, ආචාර්ය පදවි හා වෙනත් තනතුරු ඇති කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම තනතුරු සඳහා පත්කිරීම සිදුකර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

ආර්ථික, සාමාජීය, පාරිසරික ආදී විවිධ ක්ෂේත්‍රයන්හි විවිධ තලයන්හි පසුවන එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් සාමාජික රාජ්‍යයන් 2030, වසර වන විට එකම තලයකට ගෙන ඒමේ අපේක්ෂාවෙන් අරමුණු 17 ක් සහ එම අරමුණු කරා ගමන් කිරීම සඳහා ඉලක්ක 169 ක් එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ස්ථාපිත කර තිබුණි. ඒ අනුව, 2017 අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2017 ඔක්තෝබර් 03 වන දින සම්මත කර, චක්‍රලේඛ මගින් සියලුම රාජ්‍ය ආයතන දැනුවත් කර තිබුණි. ඒ අනුව මාණ්ඩලික විද්‍යාලය ඒ පිළිබඳ දැනුවත් වී අරමුණු කරා ලඟාවීමට අවශ්‍ය ඉලක්ක හඳුනාගෙන තිබුණද එම ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

## 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, 2017 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 මාර්තු 29 දිනදීය.

## 6.2 අභ්‍යන්තර විගණනය

විද්‍යාලයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොමැති වීම හේතුවෙන් විධිමත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 6.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 6.3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුලදී නිතිපතා යාවත්කාලීන කරනු ලැබිය යුතුය. එහෙත්

සැලැස්මට ඇතුළත් නොවූ රු.40,156,332 ක ප්‍රසම්පාදන කටයුතු ප්‍රවර්තන වර්ෂයේදී සිදුකර තිබුණ ද ප්‍රසම්පාදන සැලැස්ම ඒ අනුව යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) විද්‍යාලය සඳහා සූර්ය බල විදුලි පද්ධතියක් සවිකිරීම සඳහා රු.4,970,000 ක කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණු පෞද්ගලික ආයතනය වෙතින්ම ඊට අදාල පිරිවිතර ලබාගෙන තිබුණු බව තහවුරු වීම හේතුවෙන් අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය ආරක්ෂා වී නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.13 වගන්තියට පටහැනිව තෝරාගත් ලංසුකරු විසින් චෙක්පතකින් ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී විද්‍යාලය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව සමරු තිළිණ මිලදී ගැනීම සඳහා රු.2,088,475 ක් වැයකර තිබුණි. 2017 අගෝස්තු 04 දින අදාල භාණ්ඩ මාණ්ඩලික විද්‍යාලය වෙත ලබාගෙන තිබුණු අතර ඊට අදාල ඇණවුම 2017 අගෝස්තු 31 දින එනම් භාණ්ඩ ලැබීමෙන් දින 26 කට පසු පිරිනමා තිබීම හේතුවෙන් අදාල මිලදී ගැනීමේ ක්‍රියාවලිය විනිවිද භාවයෙන් තොරවූ බව නිරීක්ෂණය විය.

(ඈ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ අතිරේක 28 හි 2.14.1 වගන්තිය ප්‍රකාරව රු. මිලියන 8 ට වැඩි කොන්ත්‍රාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් මගින් අනුමත කල යුතුය. එහෙත් ඊට පටහැනිව ඇස්තමේන්තු වටිනාකම රු.46,938,698 ක් වූ ජාලගත දුරකථන පද්ධතිය ස්ථාපිත කිරීමේ ප්‍රසම්පාදනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 වගන්තියට පටහැනිව කොටස් තුනක් වශයෙන් වෙන්කර එකම කොන්ත්‍රාත්කරු වෙත ලබාදීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර විද්‍යාලයේ සේනාවිධායකවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු නොකිරීම. |